විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
**DEPARTMENT OF PENSIONS**

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය      தலைமுறையொன்றின் பெருமிதம்      **Pride of a Generation**

මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි 05/2022

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2022.06.28

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,

පොලිස්පති,

දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>2017.01.01 දිනට පසු විශ්‍රාම ගන්නා රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම</u>**

2016.01.01 දිනට පසු විශ්‍රාම ගන්නා රජයේ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ගැලපීම සම්බන්ධව ම විසින් නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2016 හා 03/2016(සංශෝධන I) ට අමතර වශයෙන් මෙම උපදෙස් ලිපිය නිකුත් කරනු ලැබේ.

02. මෙතෙක් පැවති ක්‍රමවේද අනුව ආයතනය විසින් සංශෝධිත අයදුම්පතක් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් පසුව විශ්‍රාම වැටුප් සංශෝධන ක්‍රියාවලියේදී සිදුවන ප්‍රමාදයන් මගහරවා ගැනීමට 2017.01.01 දිනට පසු විශ්‍රාම ගන්නා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් (විමධ්‍යගත) සංශෝධන අයදුම්පත් එවීමේදී පහත උපදෙස් පිළිපදින ලෙස කාරුණිකව දන්වමි.

i. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2016 අනුව ආයතනය විසින් විශ්‍රාම වැටුප් සංශෝධන අයදුම්පත්‍රය යොමුකළ පසු සංශෝධිත මාසික විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් පද්ධතිය තුළ යාවත්කාලීන කර නව විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කරනු ලැබේ. කෙසේ වෙතත් හිඟ ගෙවීම් සඳහා ප්‍රදාන පත්‍රය අදාළ ආයතනය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමුකළ පසු AR ඉදිරිපත් කළ යුතුය.

**මාළිගාවත්ත, කොළඹ 10.** மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

ii. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් ආබාධයට ලක්ව වැටුප් ගෙවනු ලබන පොලිස් නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප, වයස අවුරුදු 55 ට පසු සංශෝධනය සඳහා අයදුම්පත් යොමු කළ විට විශ්‍රාම වැටුප් ලිපිගොනුව ගෙන්වා ගෙන විශ්‍රාම වැටුප් සංශෝධනය මධ්‍යගත ක්‍රමයට සිදු කරනු ලැබේ. එහිදී සංශෝධිත විශ්‍රාම වැටුපේ පිහිටුවා හිඟ මුදල් ගණනය කර ගෙවීම් කිරීම දක්වා සම්පූර්ණ කටයුතු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ඇත.

**ජේ. ජගත් ඩී. ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

2. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව - කරු.දැ.ගැ.ස.

3. විගණකාධිපති - කරු.දැ.ගැ.ස.